පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය
மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சு
Ministry of Provincial Councils, Local Government and Sports

මගේ අංකය / எனது இல / My No. } PL/05/BA/CloseAcc/2018
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date }2018.11.22

අභ්‍යන්තර චක්‍රලේඛ 1/2018/ගිණුම් පියවීම

අතිරේක ලේකම් (සංවර්ධන හා පුහුණු /පළාත් සභා සහ පළාත් පාලන /පාලන/ව්‍යාපෘති සහ සැලසුම්),
ප්‍රධාන මූල්‍ය නිලධාරී,
ප්‍රධාන ගණකාධිකාරී/ප්‍රධාන ගණකාධිකාරී (වියදම් විමංසන),
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ජ්‍යෙ. සහකාර ලේකම් (පළාත් පාලන/පළාත් සභා/පාලන),
අධ්‍යක්ෂ (සණ අපද්‍රව්‍ය/සැලසුම්/ඉංජිනේරු),
අධ්‍යක්ෂ (පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය),
ගණකාධිකාරී (සැපයුම් හා අත්තිකාරම් ගිණුම්/ගිණුම් හා ගෙවීම්),
නීති නිලධාරී,
ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්,
ගබඩා භාර නිලධාරී,

**2018 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2018.10.19 දිනෙන් සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2018.11.05 දිනෙන් නිකුත් කරන ලද රා.ගි.ච. අංක 266/2018 සහ භා.මෙ.ච. අංක 06/2018 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

මු.රෙ. 429 අනුව සෑම මුදල් වර්ෂයකම ගිණුම් අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දින පියවිය යුතු බැවින්, 2018 වර්ෂයේ ගිණුම් ද 2018.12.31 දින පියවනු ලැබේ. ඒ අනුව, එදිනට පෙර ඒ හා සම්බන්ධ සියළු කාර්යයන් පහත සඳහන් කාල සටහනට අනුව ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බැවින්, ඒ පිළිබඳව ඔබ අංශයේ සියළුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමටත් කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

01) මෙම වර්ෂයේ ලබා ගෙන ඇති සියළුම අත්තිකාරම් මුදල් 2018.12.26 දින මධ්‍යාහ්න 12.00ට පෙර සරප්වෙත ගෙවා (අත ඉතිරි මුදල්) අදාළ රිසිට්පත සමඟ පියවීමේ වවුචරය ගිණුම් අංශයට භාර දිය යුතුය.

පළාත් සභා සහ පළාත් පාලන අංශය
மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி பிரிவு
Provincial Councils & Local Government Division
330, යූනියන් පෙදෙස, කොළඹ 02,ශ්‍රී ලංකා
330, யூனியன் பிளேஸ், கொழும்பு 02, இலங்கை.
330, Union Place, Colombo 02, Sri Lanka.
TP : +94 112 305 326/+94 112 305 327 /+94 112 303 280

ක්‍රීඩා අංශය
விளையாட்டுப்பிரிவு
Sports Division
අංක 9, පිලිප් ගුණවර්ධන පාර, කොළඹ 07, ශ්‍රී ලංකා
இல.9, பிலிப் குணவர்தன வீதி, கொழும்பு 07, இலங்கை.
No. 9, Philip Gunawardana Road, Colombo 07, Sri Lanka.
TP : +94 112 685 390/+94 112 697 934

02) සියළුම ගෙවීම් වවුචර් පහත සඳහන් පරිදි ගිණුම් අංශය වෙත භාර දිය යුතු අතර, නියමිත දිනයට පසු ලැබෙන වවුචර්පත් වලට ගෙවීම් කිරීමට නොහැකි වනු ඇත.

i. අතිකාල ගමන් වියදම් ඇතුළු සියළුම පුනරාවර්තන ගෙවීම් වලට අදාළ වවුචර්පත් 2018.12.26 දින මධ්‍යාහ්න 12.00ට පෙර,

ii. අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන්ගේ වැටුප් 2018.12.27 දින මධ්‍යාහ්න 12.00ට පෙර,

iii. සියළුම ප්‍රාග්ධන ගෙවීම් වලට අදාළ වවුචර් 2018.12.28 දින මධ්‍යාහ්න 12.00ට පෙර,

03) සියළුම ව්‍යාපෘතිවල ගිණුම් කටයුතු අවසන් කර දෙසැම්බර් මස ගිණුම් සාරාංශ (වියදම් වාර්තාව) 2018.12.27 දින ප.ව. 12.00ට පෙර ගිණුම් අංශයට ඉදිරිපත් කළ යුතුය. තවද අක් මුදල් ගිණුම් නිවැරදිව තුලනය කර එම ශේෂයන් අමාත්‍යාංශයේ අක්මුදල් ගිණුම් සමඟ, සංසන්දනය කර අදාළ ශේෂය නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් පසු,

i. 7002/0/0/449/18 (දේශීය අරමුදල්) අග්‍රිම ගිණුම යටතේ නිදහස් කර ඇති අග්‍රිම ශේෂයන් සඳහා "ලේකම්, පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය" නමින් ලියන චෙක්පතක් ඇමුණුම 01 ආකෘතිය සමග 2018.12.27 දිනට පෙර එවිය යුතුය.

ii. 7003/0/0/44/18 (ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය) අග්‍රිම ගිණුම යටතේ ඉතිරි ශේෂයන් භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ විධිවිධාන පරිදි පියවා මේ සමඟ අමුණා ඇති TOD/IMP/07 ආකෘතිය මඟින් භාණ්ඩාගාර ගිණුමට ප්‍රේෂණය වන පරිදි 2018.12.28 දින ඔබගේ බැංකු ශාඛාවට භාර දිය යුතු අතර, බැංකුවෙන් ඔබ වෙත නිකුත් කරන භර නිවේදනය, අමාත්‍යාංශයට පිටපත් 02ක් සහිතව සම්පූර්ණ කරන ලද TOD/IMP/07(I) ආකෘති පත්‍රයද සමඟ නොපමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය.

iii. ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ ලබා දී ඇති අග්‍රිම හැර වෙනත් කිසිදු ලැබීමක් 7003 අග්‍රිම සංකේතය යටතේ ගිණුම් ගත කළ නොහැකි බැවින්, වෙනත් ලැබීම් මෙම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට (TOD/IMP/07(i)) ඇතුළත් නොකළ යුතු අතර, එවැනි ලැබීම් 7002 අග්‍රිම ගිණුම් අංකය යටතේ පමණක් ගිණුම් ගත කළ යුතු වේ.

04) 2018.12.31 දිනට ඔබ භාරයේ ඇති භාණ්ඩ වට්ටෝරු ලේඛණයන්හි 2018 වර්ෂයේ සියළුම භාණ්ඩ ලැබීම් සටහන් කර හා භාණ්ඩ ඉවත් කිරීම් අඩුකර ( ලැබීම් සහ ඉවත් කිරීම් පැහැදිලිව සටහන් කළ යුතුය) ශේෂය පැහැදිලිව සටහන් කර එනම් ලේඛණය නිවැරදිව තුලනය කර භා.භා ග.ප.66 (Tr. & Aud.66) ආකෘතිය පුරවා 2019.01.03 දිනට පෙර ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත භාර දීමට පියවර ගත යුතුය.

05) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් 1503 පුනරාවර්තන වැය විෂය යටතේ හා 2201 මූලධන වැය විෂය යටතේ දරණ ලද සියළුම වියදම් පිළිබඳ වාර්තාවක් 2018.12.27 දින මධ්‍යාහ්න 12.00ට පෙර මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

06) ඉහත ලබා දී ඇති කාලයන් උපරිම වශයෙන් ලබා දී ඇති අතර, ගිණුම් පියවීම විධිමත්ව කළ යුතු බැවින් නියමිත දිනට පෙර සියළුම වවුචර් ගිණුම් අංශයට භාර දීමට විශේෂ අවධානය යොමු කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

මේ පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් නිලධාරීන් ඇමතිය හැකිය.

| | දුරකථන අංකය | දිගුව |
|---|---|---|
| 1. එම්.ඩබ්.ඒ.ආර්.පී. විජේසිංහ<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී | 2345973 | 244 |
| 2. එම්.එම්.ජේ. මෙලානි<br>ප්‍රධාන ගණකාධිකාරී | 2390676 | 254 |
| 3. ආර්.එම්.පී.සෙනෙවිරත්න<br>ගණකාධිකාරී (සැපයුම්) | 2452432 | 246 |

එච්.ටී.කමල් පත්මසිරි
ලේකම්

පිටපත - 1. ගරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්
2. ලේකම්තුමාගේ පෞද්ගලික ලේකම්
} කරු. ඉහත විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා කාර්යය මණ්ඩලය දැනුවත් කිරීමට
3. විගණකාධිපති